විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය  தலைமுறையொன்றின் பெருமிதம்  Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක - 02/2021

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2021.01.12

ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,

<u>විවිධ රාජ්‍ය ආයතන වල සේවය කොට ත්‍රිවිධ හමුදා ස්වේච්ඡා බල සේනාව වෙත ඇතුලත්ව උපරිම වයස් සීමාවට එළඹ විශ්‍රාම වැටුපක් නොලබා සේවයෙන් ඉවත් වීමට සිදු වූ අයවළුන් වෙත විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.</u>

අංක 2203/7 දරණ 2020.11.23 දිනැති ගැසට් නිවේදනය මඟින් සංශෝධනය කර ඇති යුද හමුදා, ගුවන් හමුදා සහ නාවික හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයන්ට අනුව පහත උපදෙස් නිකුත් කරමි.

1. මෙම රෙගුලාසි ගැසට් නිවේදන නිකුත් කල 2020.11.04 දින සිට බල පැවැත්වෙනු ලබන අතර විශ්‍රාම වැටුප් හිමිකම ලබා දිය යුත්තේ එදින සිටයි.

2. ඒ අනුව වසර 20 /22 ට අඩු සේවා කාලයක් පවතින ස්වේච්ඡා හමුදා නිලධාරීන් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2016 හා 03/2016(IV) අනුව මාර්ගගත ක්‍රමය ඔස්සේ යොමු කළ යුතුය. එහිදී, විශ්‍රාම ගැන්වීමේ වගන්තිය ලෙස එම ගැසට් නිවේදනයේ සංශෝධිත ත්‍රිවිධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයන්හි අදාල වගන්තිය තෝරා ගත යුතුය.

3. යුද හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධිත 29(ඕ) , 29(ග), ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධිත 34 (එ), 34 (ඕ) සහ නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධිත 26 – 2 (ඇ), 26 – 3 (ඇ) අනුව ස්වෙච්ඡා සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනයට ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයත් විශ්‍රාම වැටුප් ගණනයට යොදා ගැනීමට අනුමැතිය දී ඇත. එහිදී රජයේ සේවය සඳහා හෝ ස්වේච්ඡා හමුදා සේවය සඳහා එම සේවා කාලයට අදාලව විශ්‍රාම වැටුපක් හිමිගන්වා නොමැති විය යුතුය. එලෙස පෙර සේවා කාලයක් එකතු කර, විශ්‍රාම වැටුප් ගණනය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

**ඒ සඳහා පහත ලේඛන ඉදිරිපත් කළ යුතුය.**

1. රජයේ සේවයට අදාල ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලිපිය
2. සේවයේ ස්ථිර කිරීමේ ලිපිය
3. පොදු 53 (අ) චර්යා සටහන
4. සේවයෙන් විශ්‍රාම ගැන්වීමේ ලිපිය/ සේවය අවසන් කිරීමේ හේතු සනාථ වන ලේඛන
5. වැන්දඹු අනත්දරු දායක මුදල් අයකර ඇති බවට සනාථ වන ලේඛන

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

***සැ.යු.  : යම් විනය කටයුත්තක් නිසාවෙන් හෝ සේවය හැර යාමක් නිසාවෙන් සේවයෙන් පහ කළ නිලධාරියෙකුගේ රාජ්‍ය සේවා කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ පවතින විධිවිධාන යටතේ විශ්‍රාම වැටුප් ගණනයට යොදා ගැනීමට නොහැක.**

4. කිසියම් නිලධාරියෙකුගේ රාජ්‍ය සේවා කාලයට අදාල සේවා තොරතුරු අස්ථාන ගත වන විට එම සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනයට භාවිතා කිරීමට අදහස් කරන්නේ නම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 121 හි 5:4 අනුව අස්ථානගත සේවා කාලය පිළිබඳ වාර්තාවක්, නිලධාරී කමිටුවක් විසින් සකස් කර, නිර්දේශ සහිතව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය. ඒ සඳහා පහත උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

4.1) අස්ථානගත සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනයට එකතු කර ගැනීම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කල යුතුය. ඒ සඳහා මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු ඇතුළුව උපරිම තිදෙනෙකුගෙන් සමන්විත පරීක්‍ෂණ මණ්ඩලයක් පත් කල යුතුය.

4.2) අස්ථානගත සේවා කාලය තහවුරු කිරීම සඳහා පහත ලේඛණ යොදාගත යුතු අතර එම සියළු ලේඛණ වල සහතික කල පිටපත් අප වෙත එවිය යුතුය.

- පත්වීම් ලිපියේ සහතික කල පිටපත අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.
- එම සේවා කාලය තුල සේවය කළ බව සනාථ වන වෙනත් රාජකාරී ලිපි (සේවයේ ස්ථිර කිරීම, ස්ථාන මාරු, මුදා හැරීම්ද ඇතුළුව)
- කමිටුව විසින් අදාල නිලධාරියාගේ සේවා කාලය තුල ඔහු සමඟ සේවය කළ සමකාලීන නිලධාරීන්ගේ ප්‍රකාශ ලබාගෙන සහතික කර ඉදිරිපත් කළ යුතුය. (එම ප්‍රකාශ ලබා දෙන නිලධාරීන්ගේ සේවා වාර්තාද සමඟ සේවා කාලයන් විධිමත් පරිදි සනාථ කර ඉදිරිපත් කළ යුතුයි)
- කමිටු වාර්තාව සඳහා යොදාගත් ලිපි ලේඛණ ඇමුණුම් ලෙස සහතික කර ඉදිරිපත් කල යුතුය.

4.3) පරීක්ෂණ කමිටුව විසින් නම හා නිල මුද්‍රාව තබා සහතික කරන ලද නව චර්යා සටහන් පත්‍රය. (කමිටුවේ සියළු සාමාජිකයන් විසින් නම සහිත නිල මුද්‍රාව තබා සහතික කරන ලද මුල් පිටපත ඉදිරිපත් කළ යුතුයි)

4.4) මෙම සියළු තොරතුරු හා ලේඛණ පරීක්ෂා කර, පරීක්ෂණ මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් ගණනයට යොදා ගත හැකි සේවා කාලය පැහැදිලිව දක්වා පරීක්‍ෂණ වාර්තාවක් සකස් කර නිර්දේශ සහිතව අනුමැතිය සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුය.

4.5) ඉහත ලේඛණ විධිමත්ව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නිලධාරියාට අදාල අස්ථානගත සේවා කාලයෙන් සනාථ කර ගත හැකි සේවා කාලය ස්වේච්ඡා සේවා කාලය සමඟ ඒකාබද්ධ කර විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ.

5. විශ්‍රාම වැටුප් ගණනයට එක් කරන සේවා කාලය සඳහා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී තිබීම අනිවාර්ය වන අතර යම් නිලධාරියකු අරමුදලේ දායක මුදල් නැවත ලබා ඇත්නම් 2008.01.30 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2008 හි දක්වා ඇති පරිදි එම නිලධාරීන්ගෙන් දායක මුදල් ගණනය කොට නැවත අයකර ගත යුතුය.

**ඒ.ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂ ජනරාල්

පිටපත්:-

1. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
2. ලේකම්, ආරක්‍ෂක අමාත්‍යාංශය
3. විගණකාධිපති